# සොබා පරිසර පුවත් සංග්‍රහය

පරිසර අමාත්‍යාංශය යටතේ වන විවිධ අංශයන්හි වැඩසටහන් පිළිබඳව ඇතුළත් කරමින් ත්‍රෛමාසික කෙටි පුවත් සංග්‍රහයක් ලෙස සොබා පරිසර පුවත් සංග්‍රහය ප්‍රකාශයට පත් කරයි.මෙම පුවත් සංග්‍රහය අමාත්‍යාංශයේ සියලුම අංශවල දැනුවත්භාවය සඳහා නියමිත කාර්තුව තුළ බෙදා හරිනු ලබයි.



ත්‍රෛමාසික කෙටි පුවත් සංග්‍රහය
# සොබා පරිසර පුවත්
vii වෙළුම | පරිසර අමාත්‍යාංශය | ජුනි/ජූලි කලාපය 2010

# ජගත් කාන්තාරකරණය වැළැක්වීමේ දිනය සැමරීම




මෙම අවස්ථාවට සහභාගි වූ ඩබ්ලිව්. එම්. විජේසූරිය මහතා, අතිරේක ලේකම් (ස්වභාවික සම්පත් කළමනාකරණ) වජිර නාරම්පනාව මහතා අතිරේක ලේකම් (පාලන හා ප්‍රවර්ධන) ඩී. එස්. වීරරත්න මහතා සභාපති (භූමි හායනය වැලැක්වීම පිළිබඳ ජාතික විද්වත් කමිටුව) ආනන්ද මල්ලවතන්ත්‍රි මහතා, (සහකාර නේවාසික නියෝජිත) හා ආචාර්ය ජේ. සී. සමරසිංහ මහතා, සභාපති (ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව)

කාන්තාරකරණය වැළැක්වීමේ සම්මුතියේ කේන්ද්‍රස්ථානය ලෙස කටයුතු කරනු ලබන පරිසර අමාත්‍යාංශය මෙවර ජගත් කාන්තාරකරණය වැළැක්වීමේ දිනය (ජුනි 17) සැමරීම සඳහා භූමි හායනය පිළිබඳ ජාතික මට්ටමේ දෙදින සමුළුවක් (First National Symposium on Land Degradation: Present Status and Future Challenges) පවත්වනු ලැබිය.

මෙවර ජගත් කාන්තාරකරණය වැළැක්වීමේ දිනයේ තේමාව වූයේ "පාංශු ජෛව විවිධත්වයෙන් පොහොසත් පස පරිසර පද්ධතීන්වල හා ජීවනෝපායන්ගේ යහපැවැත්මට හේතු වේ." යන්නයි. (Rich Soil Biodiversity : Welbeing in Livelihoods and Ecosystems) 2010 වසර අන්තර්ජාතික ජෛව විවිධත්ව වසර ලෙස නම් කර ඇති බැවින් පෘතුවිය මත ජීවයේ පැවැත්ම හා ජීවී පැවැත්ම කෙරෙහි ජෛව විවිධත්වයේ වැදගත්කම පිළිබඳව අවධානය යොමු කර ඇත. එබැවින් මෙවර ජගත් කාන්තාරකරණය වැළැක්වීමේ දින තේමාවේද පාංශු ජෛව විවිධත්වය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කර තිබුණි.

ජගත් කාන්තාරකරණය වැළැක්වීමේ දිනය වෙනුවෙන් සැලසුම් කල මෙම සමුළුව ජුනි මස 17 හා 18 යන දෙදින හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි පර්යේෂණ හා පුහුණු ආයතනයේදී පවත්වන ලදී. පරිසර අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ ශ්‍රී ලංකා කෘෂිකර්ම පර්යේෂණ ප්‍රතිපත්ති සභාව මගින් එම සමුළුව සංවිධානය කරනු ලැබීය. භූමිය හා සම්බන්ධ රාජ්‍ය ආයතන, රාජ්‍ය නොවන ආයතන, විශ්ව විද්‍යාල මෙන්ම පෞද්ගලික අංශයේ විද්වතුන් රැසක් මෙම දෙදින සමුළුව සඳහා සහභාගී වූහ.

# සොබා

ත්‍රෛමාසික කෙටි පුවත් සංග්‍රහය

## පරිසර පුවත්

viii වෙළුම | පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යාංශය | හතරවන කලාපය - 2009

# හරිත ගම්මාන වැඩසටහන




පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යාංශයේ තිරසර පරිසර අංශය මගින් ක්‍රියාත්මක කරනු ලබන හරිත ගම්මාන වැඩසටහන සඳහා විවිධ දිස්ත්‍රික්කයන් ආවරණය වන පරිදි මීරිය බැද්ද, ඕබ්බෙල්ගම, හිනැටිපන, පොල්ලේබැද්ද, ඉබන්ඕවිට හා බැද්දේගම (බටහිර) යන ගම්මාන හයක ප්‍රතිලාභීන් 600ක් සඳහා උපකරණ ලබාදීම 2009 ඔක්තෝම්බර් 15, 26 හා නොවැම්බර් 06, 11 යන දිනවල ගරු පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍ය පාඨලී චම්පික රණවක මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සිදුවිය.




මෙහිදී කාර්යක්ෂම ශක්ති පරිභෝජන රටාවන් ඇතිකිරීම අරමුණු කරගනිමින් එක් එක් පවුල් ඒකකය වෙත කාර්යක්ෂම මැටි දර උදුනක් සහ කාබනික ගොවිතැන ප්‍රචලිත කිරීම සඳහා ගෙවතු වගා කට්ටලයක් බැගින් ලබා දෙන ලදි. ඊට අමතරව ඉහත උපකරණ බෙදා දීමට සමාන්තරව ග්‍රාමීය ජෛව විවිධත්වය හා හරිත වැස්ම වර්ධනය කිරීමේ අරමුණින් එම ගම්මානවල පාසැල් ආශ්‍රිත ඔසු උයන් පිහිටුවීමද, වන පැල හා පලතුරු පැල බෙදාදීම ද සිදු කරන ලදි.

සොබා

ත්‍රෛමාසික කෙටි පුවත් සංග්‍රහය

# පරිසර පුවත්

V වෙළුම | පරිසර හා ස්වාභාවික සම්පත් අමාත්‍යාංශය | දෙවන කලාපය 2008

## ගම්පහ මාලිගාතැන්න ආරණ්‍ය සේනාසනයේ පියකරු පුරවර වැඩසටහන



ගරු අමාත්‍යතුමා විසින් ජීව පොවුවක් භාවිතා කරමින් ...

පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන පියකරු පුරවර වැඩසටහන මගින් 2008 අප්‍රේල් මස 06 වන දින ගම්පහ මාලිගාතැන්න ආරණ්‍ය සේනාසනයේදී ද වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදී. මෙහිදී දහම් පාසැල් ළමුන්ට කසළ වර්ගීකරණය හා නිවැරදිව කසළ බඳුන් භාවිතය පිළිබඳ දැනුවත් කරන ලදී. දහම් පාසැල් ළමුන් හට පැළ බෙදා දීමක් ද මෙහිදී සිදු විය. තවද පරිසර හා ස්වභාවික සම්පත් ගරු අමාත්‍ය පාඨලී චම්පික රණවක මැතිතුමා විසින් ආරණ්‍ය සේනාසන භූමියේ පැළ රෝපණ වැඩසටහනක් සිදු කරන ලදී.

## ලෝක මිහිතල දිනය

2008 අප්‍රේල් 22 වන දිනට යෙදෙන ලෝක මිහිතල දිනය වෙනුවෙන් අධ්‍යාපනික හා වෙළඳ ප්‍රදර්ශනයක් සිගිරිය හස්ත කර්මාන්ත ගම්මානයේදී පවත්වන ලදී. මෙහි පරිසර හිතකාමී අත්කම් නිර්මාණ විශාල ප්‍රමාණයක් දැක ගත හැකි විය. වේවැල්, පන් වර්ග, තල කොළ, ලී ආදිය යොදා ගෙන නිම කරන ලද භාණ්ඩ අපගේ දේශීය අනන්‍යතාවය හුවා දක්වන කැඩපතක් බඳු විය. ඉහත වැඩසටහනින් අනතුරුව පරිසර නියමුතටයින් හට ලාංඡන පැළඳවීමක් ද සිදු කරන ලදී. තවද පාසැල් ළමුන් දැනුවත් කිරීමේ වැඩසටහනක් ද එදින පැවැත්විය. මෙම අවස්ථාවට පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යාංශය වෙනුවෙන් අතිරේක ලේකම් ඩබ්ලිව්. ඒ. විජේසූරිය මහතා ජාතික ඕසෝන් ඒකකයේ අධ්‍යක්ෂක ඩබ්ලිව් එල්. සුමතිපාල මහතා සහ තිරසර පරිසර අංශයේ අධ්‍යක්ෂ චන්දන රණවීරආරච්චි මහතා ද සහභාගි විය.



## පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යාංශයේ බක්මහ උළෙල 2008

පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති දෙපාර්තමේන්තු එකමුතුව 2008 අප්‍රේල් මස 25 වන දින දවස පුරා අමාත්‍යාංශ පරිශ්‍රයේ දී "පරිසර බක්මහ උළෙල" පවත්වන ලදී. තරඟ ඉසව් ගණනාවක් පවත්වන ලද අතර ඒ සඳහා සියලු තරාතිරමකම නිලධාරීන් හට සහභාගි වීමට හැකි විය. පරිසර කුමරා සහ පරිසර කුමරිය තේරීම, අංගම්පොර යන අවස්ථා ඉතා සිත් ගන්නා සුළු විය. ජයග්‍රාහක ජයග්‍රාහිකාවන් සඳහා වටිනා ත්‍යාග පිරිනමන ලදී. සහයෝගය, එකමුතුකම, බෙදාහදාගැනීම වැනි යහපත් සමාජ සංකල්ප වර්ධනය උදෙසා මෙම පරිසර බක්මහ උළෙල කදිම තෝතැන්නක් විය.



ත්‍රෛමාසික කෙටි පුවත් සංග්‍රහය

# සොබා පරිසර පුවත්

ix වෙළුම | පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යාංශය | පළමුවන කලාපය - 2010

## 2010 නව වසරේ රාජකාරි ආරම්භ කිරීම



**2010** ජනවාරි **01** දින නව වසර උදාවත් සමඟින් පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍ය ගරු පාඨලී චම්පික රණවක මැතිතුමා පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යාංශයේ සේවක මහත්ම මහත්මීන් හා එක්ව අළුත් අවුරුද්ද සමරමින් නව වසරේ රාජකාරි ආරම්භ කරණු ලැබීය.

## අන්තර්ජාතික ජෛව විවිධත්ව වසර සැමරීම



**2010** වසර ,අන්තර්ජාතික ජෛව විවිධත්ව වසර, ලෙසින් නම් කර ඇති අතර එය සැමරීම සඳහා ජෛව විවිධත්ව අංශය මගින් "ජෛව විවිධත්වය අපගේ ජීවයයි" තේමාව යටතේ වූ නාම පුවරුව විවෘත කිරීම සහ "ජෛව විවිධත්ව පැතිකඩ සහ සංරක්ෂණ ක්‍රියාකාරී සැලැස්ම - (බස්නාහිර පළාත)" නම් ප්‍රකාශනය ගරු පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් එළි දක්වන ලදි. එදින ශ්‍රී ලංකාවේ ජෛව විවිධත්වය සංරක්ෂණය කිරීම පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම සඳහා විස්තරාත්මක තොරතුරු ඇතුළත් පත්‍රිකාවක් බෙදා හැරීම ද ජෛව විවිධත්ව වසර වෙනුවෙන් මුද්‍රාවක් නිකුත් කිරීම සහ "මා ඔය සහ අපි" ප්‍රකාශනය එළි දැක්වීම ද සිදුවිය.



එයට සමගාමීව තිරසර පරිසර අංශය මගින් හරිත තවය ව්‍යාපෘතිය යටතේ පියකරු පුරවරයක් උදෙසා "නාගරික තෙත්බිම් සුරැකීම" යන තේමාව මත ක්‍රියා කරනු ලබන තෙත් බිම් හා ඊ ආශ්‍රිත පරිසර සංරක්ෂණය කිරීම යටතේ වර්තමානයේ තර්ජනයට ලක්ව ඇති බැද්දගාන දියවන්නා ඔය ආශ්‍රිතව බිම් ප්‍රදේශය ජෛව විවිධත්ව උද්‍යානයක් හා තුරුළු අභය භූමියක් ලෙසින් ස්ථාපිත කිරීමේ සමාරම්භක ශිලා උත්සවය **2010** පෙබරවාරි **18** වන දින පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් සිදු විය.



# සොබා පරිසර පුවත්

ත්‍රෛමාසික කෙටි පුවත් සංග්‍රහය

vii වෙළුම | පරිසර අමාත්‍යාංශය | දෙවන කලාපය 2010


## පරිසර අමාත්‍යතුමාගේ වැඩ භාර ගැනීම



නව පරිසර අමාත්‍ය අනුර ප්‍රියදර්ශන යාපා මැතිතුමා අමාත්‍යාංශයේ වැඩ භාර ගනිමින්.....

පරිසර අමාත්‍යවරයා ලෙස ගරු අනුර ප්‍රියදර්ශන යාපා මැතිතුමා 2010.04.28. දින පරිසර අමාත්‍යාංශයේ වැඩ භාර ගන්නා ලදී. මෙම උත්සව අවස්ථාවට අමාත්‍යාංශය යටතේ ඇති සියලු ආයතන වල කාර්‍ය මණ්ඩලය සහභාගි විය. හිටපු ජනමාධ්‍ය අමාත්‍යවරයා ලෙස මහඟු සේවයක් ඉටු කල මෙතුමා හට පරිසර අමාත්‍යාංශය යටතේද අද්විතීය සේවාවක් ඉටු කිරීමට ශුභාශිංසන පිරිනමමු.

## නියෝජ්‍ය අමාත්‍යතුමාගේ වැඩ භාර ගැනීම

පරිසර අමාත්‍යාංශයේ නියෝජ්‍ය අමාත්‍යධූර්ය සඳහා මෙවර මහනුවර දිස්ත්‍රික්කයෙන් පාර්ලිමේන්තුව නියෝජනය කරමින් පෙරී පත්වූ ෆයිසර් මුස්තාපා මහතා වැඩ භාර ගැනීම 2010.05.07. වන දින සිදු කෙරිණ. පරිසර අමාත්‍යාංශයේ වැඩ භාරගත් මෙතුමාට පරිසර අමාත්‍යාංශයේ කාර්‍යමණ්ඩලය වෙනුවෙන් අපගේ ශුභාශිංසන පිරිනමමු.



ත්‍රෛමාසික කෙටි පුවත් සංග්‍රහය

# සොබා පරිසර පුවත්

IV වෙළුම | පරිසර හා ස්වාභාවික සම්පත් අමාත්‍යාංශය | සතරවන කලාපය 2008

## කන්තලේ පරිසර ගැටලු රැසකට ගරු පාරිසරික හා ස්වාභාවික සම්පත් අමාත්‍යතුමාගෙන් කඩිනම් විසඳුම්

පරිසර හා ස්වාභාවික සම්පත් අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කෙරන "ඇමති ගමට ජංගම සේවය" පසුගියදා කන්තලේ ප්‍රදේශයේදී පැවැත්විණි. මෙහිදී ප්‍රදේශයේ පරිසර ආශ්‍රිත ප්‍රශ්න 193 ක් ඉදිරිපත් වූ අතර ඉන් 110 ක් සඳහා ක්ෂණික විසඳුම් ලබා දීමට පරිසර හා ස්වාභාවික සම්පත් ඇමති පාඨලී චම්පික රණවක මහතාට හැකිවී තිබේ.

ප්‍රදේශයේ වැඩිම ගැටලු සංඛ්‍යාවක් මතු වී ඇත්තේ භූ විද්‍යා හා පතල් කැණීම් කාර්යාංශයට අදාල ගැටලු වන වැලි ගොඩදැමීම, කළුගල් කැඩීම ආදිය පිළිබඳවය. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අදාලව ප්‍රශ්න 68 ක් තිබූ අතර, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව සහ මධ්‍යම පරිසර අධිකාරියට අදාලව ගැටලු ඉදිරිපත් වී තිබුණි. ඉදිරිපත් වූ ගැටලු වලින් ප්‍රශ්න 73 ක් විසඳීම සඳහා අදාල ආයතන වලට ඉදිරිපත් කර තිබුණි.

## උඩවලව වනෝද්‍යානය නමින් මුද්දර පෙළක් එළි දක්වයි

උඩවලව ජාතික වනෝද්‍යානය හා එහි සතුන් නිරූපණය කරමින් මුද්දර පෙළක් එළි දැක්වීම පරිසර හා ස්වාභාවික සම්පත් ගරු අමාත්‍ය පාඨලී චම්පික රණවක, තැපැල් හා විදුලි සංදේශ ගරු අමාත්‍ය රාවුෆ් හකීම් යන අමාත්‍යවරුන්ගේ ප්‍රධානත්වයෙන් පරිසර අමාත්‍යාංශ ශ්‍රවණාගාරයේදී පැවැත්විය.

තැපැල් දෙපාර්තමේන්තුවේ මුද්දර කාර්යාංශය මගින් නිකුත් කර ඇති මුද්දර පෙළට වටිනාකම් හතරකින් යුතු මුද්දර ඇතුළත්ය. රුපියල් 05 ක වටිනාකමින් යුත් මුද්දරයට මී හරකාගේ රුවද, රුපියල් 15 ක වටිනාකමකින් යුත් මුද්දරයට ශ්‍රී ලංකා අලියාගේ රුවද, රුපියල් 40 ක වටිනාකමින් යුත් මුද්දරයට තිත්මුවාගේ රුවද, රුපියල් 45ක වටිනාකමකින් යුතු මුද්දරයට අළු වඳුරාගේ රුවද ඇතුලත් කර අලංකාර ලෙස මෙම මුද්දර නිර්මාණය කර ඇත. ශ්‍රී ලංකාවේ වන සතුන් වෙනුවෙන් මුද්දර නිකුත් කරනු ලබන දෙවන අවස්ථාව මෙයයි. මීට පෙර විල්පත්තු වනෝද්‍යානය වෙනුවෙන් මුද්දර පෙළක් තැපැල් දෙපාර්තමේන්තුව මගින් නිකුත් කර ඇත.

මෙම අවස්ථාවේදී වැඩි දුරටත් අදහස් දැක්වූ අමාත්‍යවරයා වනෝද්‍යානය පිළිබඳව දැනට විවිධ ගැටලු උද්ගත වී ඇති බවත්, ඉතා ඉක්මණින් එම ගැටළුව මගහැරවීමට කටයුතු කරන බවත් කියා සිටියේය. කුමණ, විල්පත්තු වැනි දැනට වසා දමා ඇති වනෝද්‍යාන වල ආරක්ෂක තත්වයන් තහවුරු කළ පසු ලබන වසරේදී යළි විවෘත කිරීමට කටයුතු යොදා ඇති බවත්, ලුණුගම්වෙහෙර වනෝද්‍යානයේ සියලු පහසුකම් නවීකරණය කිරීමට ලබන වසර තුළ පියවර ගන්නා බවත් සඳහන් කළේය.

මෙම අවස්ථාවට තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යාංශයේ ලේකම් එම්.එන්. පියසේන පරිසර හා ස්වාභාවික සම්පත් අමාත්‍යාංශයේ ලේකම් එම්.ඒ.ඩී. ජයතිලක, තැපැල්පති මර්වින් සේනාධීර, මුද්දර කාර්යාංශයේ අධ්‍යක්ෂ වාල්ස් එකදුවංශ, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ඩබ්.ඒ.ඩී. විජේසූරිය යන මහත්වරුන් සමග පරිසර අමාත්‍යාංශය හා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව පරිසර අධිකාරිය හා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව නියෝජනය කරමින් නිලධාරීන් පිරිසක් සහභාගී වූහ.

ත්‍රෛමාසික කෙටි පුවත් සංග්‍රහය

# සොබා පරිසර පුවත්

V වෙළුම | පරිසර හා ස්වාභාවික සම්පත් අමාත්‍යාංශය | පළමු කලාපය 2008

## පියකරු පුරවර සහ හරිත ගම්මාන දිස්ත්‍රික් සම්බන්ධීකාරකවරුන් පුහුණු කිරීමේ වැඩමුළුව



"පියකරු පුරවර" සහ "හරිත ගම්මාන" වැඩ සටහන ක්‍රියාත්මක කිරීම සඳහා තෝරාගෙන ඇති දිස්ත්‍රික් සම්බන්ධීකාරකවරුන් හට දෙදින නේවාසික වැඩමුළුවක් පරිසර හා ස්වාභාවික සම්පත් ගරු අමාත්‍ය පාඨලී චම්පික රණවක මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2008/03/15 සහ 16 යන දින වලදී තුල්හිරිය මාර්ස් හෝල්ඩින් පුහුණු මධ්‍යස්ථානයේ දී පැවැත්විය. එහි දී පොළොන්නරුව දිස්ත්‍රික් සම්බන්ධීකාරක පූජ්‍ය සඳුන්පුර නාලකාලංකාර හිමියනට අමාත්‍යවරයා විසින් සහභාගීත්ව සහතික පත්‍රය පිළිගැන්වූ අවස්ථාව සඳහා පරිසර හා ස්වාභාවික සම්පත් අමාත්‍යාංශයේ උපදේශක පූජ්‍ය හැඩිගල්ලේ විමලසාර හිමියන් ද තිරසර පරිසර අංශයේ අධ්‍යක්ෂක ඒකනායක මහතා ද සහභාගී විය.

## මීගමුව මහ නගර සභාවේ පිළිසරු වැඩ සටහන

පරිසර හා ස්වාභාවික සම්පත් අමාත්‍යාංශය පිළිසරු වැඩ සටහන යටතේ මීගමුව මහ නගර සභාවේ කොම්පෝස්ට් ව්‍යාපෘතිය මීගමුව කුරණ මේජර් රාජ් ක්‍රීඩාංගනයේ දී පරිසර හා ස්වාභාවික සම්පත් ගරු අමාත්‍ය පාඨලී චම්පික රණවක මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සිදු විය. මෙහිදී පළමු කොම්පෝස්ට් බෑගය අමාත්‍යවරයාට අලෙවි කිරීම සිදුවිය. මෙම අවස්ථාවට සිවිල් ගුවන් සේවා අමාත්‍ය සරත් කුමාර ගුණරත්න මහතා ද සහභාගි වූ අතර මීගමුව මහ නගර සභාවේ පුරපති නිමල් ලාන්සා මහතා විසින් මෙම උත්සවය සංවිධානය කර තිබුණි.



## පිළිසරු කසළ කළමනාකරණ ජාතික වැඩ පිළිවෙල

වසර 2012 දී කසළින් තොර ශ්‍රී ලංකාවක් බිහිකිරීමේ අරමුණින් ක්‍රියාත්මක කෙරෙන පිළිසරු කසළ කළමනාකරණ ජාතික වැඩපිළිවෙල ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2008.03.24 වන දින ජනාධිපති ලේකම් කාර්යාලයේ දී පැවැත්විණ.

පිළිසරු ලාංඡනය ජනාධිපතිතුමා අතින් එළි දැක්වීමත්, පිළිසරු ක්‍රියාකාරී සැලැස්ම ඇමති පාඨලී චම්පික රණවක මැතිතුමා අතින් ජනාධිපතිවරයා වෙත පිළි ගැන්වීමත් සිදු විය.

පරිසර හා ස්වාභාවික සම්පත් අමාත්‍යාංශය පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය එක්ව පළාත් පාලන ආයතන 330 ක් සම්බන්ධ කරගෙන ජාතික මට්ටමෙන් මෙම වැඩපිළිවෙල ක්‍රියාත්මක කෙරේ.

මෙහිදී පළාත් පාලන ආයතන කීපයකටම සම්මාන පිරිනැමීම ද සිදු විය.

වර්ෂ 2012 දී නිකසල - නිශ්ල පිරුණු රටක් සඳහා පිළිසරු කසළ කළමනාකරණ ජාතික වැඩපිළිවෙල ක්‍රියාත්මක වේ. මධ්‍යම පරිසර අධිකාරිය මඟින් ක්‍රියාත්මක කරන මෙම වැඩපිළිවෙල මඟින් කසල ප්‍රතිචක්‍රීකරණය කිරීම, කොම්පෝස්ට් කිරීම සිදු කරන අතර නිකසල රටක් ඇති කිරීම ප්‍රධාන අරමුණ වේ.